## නවගත්තේගම ප්‍රාදේශීය සභාව

### නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ තනතුරු පුරප්පාඩු

නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවත්නා ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ පහත සඳහන් තනතුරට සුදුස්සෙකු තෝරා පත් කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති නවගත්තේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *පුරප්පාඩු තනතුර :*

| | | | |
|---|---|---|---|
| I. | තනතුරු නාමය | :- | වැඩ/ක්ෂේත්‍ර කම්කරු |
| II. | තනතුරු ගණන | :- | 01 |
| III. | වැටුප් ක්‍රමය - මාසික | :- | අංක 3/2016 හා 2016.02.25 දිනැති රා. ප. චක්‍රලේඛයට අනුව PL-1-2016 රු. 24,250-10x250-10 x270-10 x300-12 x330-36410 ක් වේ. |
| I V. | අධ්‍යාපන සුදුසුකම් | :- | අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් විෂයන් 2 ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) (දැනට අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමෙන් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදළ වේ.) |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

1. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුය.
3. අයදුම්කරු නවගත්තේගම ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ තුන් අවුරුද්දකට නොඅඩු කාලයක ස්ථිර පදිංචිකරුවෙක් විය යුතුය. (වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථ කර තිබිය යුතුය.)
4. අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙක් නොවිය යුතුය.
6. පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම යටතේ දැනට සේවයේ නියුතු නිලධාරින්ට ද ඉහත තනතුරු සඳහා ඉල්ලුම් කළ හැකි අතර, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වන වසර 5 ක කාලය තුළ වරදකට (අවවාද කිරීමක් හැර) දඬුවමක් ලබා නැත්තාවූ ද මෙම කාලය තුළ සියළු වැටුප් වර්ධක නියමිත දිනට ලබා ගත්තාවූ ද සතුටුදායක සේවා කාලයක් ඇති අයෙකු ද විය යුතුයි.
7. අයදුම්කරුවන් තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.
ii. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය.
iii. පත් වීම අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වන්නේය.

iv. මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලටද, රජය හෝ පළාත් සභාව විසින් වරින්වර නිකුත් කරන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලු සේවකයින් බැඳී සිටිය යුතුය.

04. බඳවා ගැනීමේ ක්‍රමය

01. අවශ්‍යතාවය අනුව ලිඛිත/ව්‍යුහගත හෝ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයෙකු තෝරා ගැනේ.

02. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතික පත්වල සහතික කළ පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

*(අ)* උප්පැන්න සහතිකය;

*(ආ)* අධ්‍යාපන සහතික.

03. තම පදිංචිය සහතික කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ;

04. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරීගෙන් ලබා ගත් සහතිකයක් විය යුතුය.);

05. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම් එම සහතික;

06. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ;

07. අයදුම්කරුවන් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2017.10.09 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රදේශීය සභාව, නවගත්තේගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවර අයදුම් කරන තනතුර පැහැදිළිව සඳහන් කළ යුතුය. නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම් පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

එච්.එම්.එස්. හේරත්,
ලේකම්,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2017 සැප්තැම්බර් මස 11 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

නවගත්තේගම ප්‍රාදේශීය සභාව

*ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණියේ වැඩ/ක්ෂේත්‍ර කම්කරු III ශ්‍රේණියට බඳවා ගැනීමේ අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග:——————————————.
මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————.
02. තැපැල් ලිපිනය :——————————————.
03. උපන් දිනය :- වර්ෂය :——————. මාසය:—————— දිනය :——————
04. අයදුම්පත භාරගන්නා අවසාන දිනට වයස :- අවුරුදු:——————. මාස :—————— දින :——————
05. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————.
06. ස්ත්‍රී / පුරුෂ භාවය :——————————————.
07. විවාහක / අවිවාහක භාවය :——————————————.
08. ජාතිය :——————————————.
09. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන්ද / ලියාපදිංචි වීමෙන්ද යන වග :- ..............................................
10. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවන්න):——————————————.

11. ඔබ දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්තද? :————————————————.

එසේ නම් තනතුර :——————.   සේවා ස්ථානය:————————————————.

එම පත්වීමේ ස්වභාවය ස්ථිර/අනියම්/තාවකාලික යන වග :————————————————..

12. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————————————————.

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය වුවහොත් හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව දනිමි.

————————————.

අයදුම්කරුගේ අත්සන

දිනය :——————.

13. *ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

(දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන අයදුම්කරුවන් සඳහා)

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ........................................................................................................ මහතා/මහත්මිය/මෙනවිය ........................................................................................................ වැනි දින සිට මෙම කාර්යාලයේ ..... ........................................................................................ ස්ථිර/තාවකාලික/අනියම්/කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන බවත්, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම සහ හැසිරීම සතුටුදායක බවත්, ඉහත 1 සිට 8 දක්වා සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් 2017 ............................................ මස ............................ වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————————————.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————

සහතික කරන අයගේ සම්පූර්ණ නම :——————

පදවිය :——————

ලිපිනය :——————